# ශ්‍රී ල නි ප ප්‍රතිපත්ති

ශ්‍රී ල නි ප ප්‍රතිපත්ති යනු කුමක් ද යන ප්‍රශ්නයට පිළිතුරක් ලබාගත හැකිවන්නේ පනස්හයේ ප්‍රතිපත්ති යනු කවරේදැයි දැනගැනීමෙන් ය. වෙනත් පක්ෂවලට වඩා ශ්‍රී ල නි පක්ෂයේ වෙනසක් වෙයි. අනෙක් පක්ෂ සංවිධානයකරනු ලැබුයේ පුද්ගලයන් කිහිප දෙනකුගේ අවශ්‍යතාව පරිදි ය. ඒ පක්ෂ කිනම් ජන කොට්ඨාසයක් නියෝජනය කළ ද එහි ප්‍රතිපත්ති සකස්කරනු ලැබුයේ පක්ෂය ආරම්භකිරීමට මුල් වූ කිහිපදෙනකුගේ සිතැඟි පරිදි ය. මෙරට බිහිවූ මාක්ස්වාදී පක්ෂවල ප්‍රතිපත්ති තීරණය කළෝ අඩුම තරමින් මෙරට පුරවැසියෝවත් නො වූහ. ඇමරිකාවේ දී හා යුරෝපයේ දී, විශේෂයෙන් ම බ්‍රිතානියේ දී ලැබුණු මාක්ස්වාදී අදහස් ඇතිව පැමිණි තරුණයන් කිහිප දෙනෙක් ඊනියා ජාත්‍යන්තර මාක්ස්වාදීනට අවශ්‍ය ආකාරයට මෙරට පළමු දේශපාලන පක්ෂය පිහිටුවූහ. ලංකා සමසමාජ පක්ෂයට පෙර බටහිර අර්ථයෙන් දේශපාලන පක්ෂයක් යැයි කිවහැකි සංවිධානයක් මෙරට නොතිබිණි ද, නොයෙකුත් දේශපාලන සංවිධාන විවිධ පුද්ගලයන්ගේ අවශ්‍යතා පරිදි පිහිටුවාගෙන තිබුණි. පොන්නම්බලම් අරුණාචලම් මහතා දෙමළ මහජන සභාව නමින් පළමු දෙමළ ජාතිවාදී සංවිධානය දෙවැනි දශකයේ දී ම ආරම්භ කෙළේ ය. මා ඒ සංවිධානය දෙමළ ජාතිවාදී සංවිධානයක් ලෙස  නම්කරන්නේ බස්නාහිර පළාත සඳහා උගත් දෙමළ ජනයාට වෙන ම ආසනයක් ව්‍යවස්ථාදායක සභාවේ තිබිය යුතු යැයි ඉල්ලීම සඳහා ම එය පිහිටුවාගනු ලැබීම නිසා ය. එහි අරමුණ වූයේ ව්‍යවස්ථාදායක සභාවෙහි සිංහල නියෝජනත්වයට වඩා දෙමළ නියෝජනත්වයක් ලබාගැනීමත් මෙරට සිංහලයන්ට හිමිවිය යුතු තැන අහිමිකිරීමත් ය. සියයට හැත්තෑපහකට වැඩි වූ සිංහල ජනයාට වඩා දෙමළ ජනයාට ව්‍යවස්ථාදායක සභාවෙහි නියෝජනත්වයක් ලබාගැනීම ඇතැම් දෙමළ උගතුන්ට 1920 ට පෙර පවා අවශ්‍ය විය. ඒ වන විට සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම පිළිබඳ හිතාවත් නොතිබූ බැවින් මේ රටේ සියළු ප්‍රශ්නවලට මුල සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම යැයි කියන්නන්ගේ සිංහල විරෝධී බව ද, ඔවුන්ගේ මතවාදවල මෙන් ඔවුන් ගේ ද පුහු බව තේරුම්ගත හැකි ය.

විසිගණන්වල එංගලන්තයේ බටහිර ක්‍රිස්තියානි (ඇංග්ලිකන්) නූතනත්වයෙහි ඉහළම සංස්කෘතික ආයතනය යැයි කිවහැකි ඔක්ස්ෆඩ් සරසවියෙහි අධ්‍යාපනය ලබා ලංකාවට පැමිණි බණ්ඩාරනායක මහතා සිය පළමු සිංහල කතාව ඉතා අමාරුවෙන් කෙළේ යැයි වාර්තා වෙයි. ගෙදර, පාසලේ හා සරසවියේ තිබූ පරිසරය අනුව ඒ මහතාට එයට වඩා දෙයක් කළ නො හැකිවිය. එහෙත් ඒ මහතා සිංහලෙන් කතාකිරීමට උත්සාහ ගැනීමෙන් ම පෙන්නුම් කරන්නේ ඒ මහතාගේ ජාතිකත්වය පිළිබඳ හැඟීම ය. කෙසේ වෙතත් ඒ මහතා වැඩිකල් නොගොස් සිංහල මහා සභාව නමින් දේශපාලන සංවිධානයක් ඇරඹී ය. එය දෙමළ ජනයාගේ අයිතියක් නැතිකිරීම සඳහා වූවක් නො වීණි. අරුණාචලම් මහතාගේ සංවිධානය සිංහලයන්ට හිමිතැන අහිමිකිරීම සඳහා පිහිටුවනු ලැබුණු බැවින් ඒ ජාතිවාදී සංවිධානයක් වෙයි. එහෙත් සිංහල මහා සභාවට එවැනි ජාතිවාදී අරමුණු නො වී ය. එය හුදෙක් සිංහලයන් සමගිකිරීමට හා සිංහලයන්ට හිමි තැන ලබාගැනීම සඳහා පිහිටුවනු ලැබුවකි. එසේ වුවත් බණ්ඩාරනායක මහතාට රට ගැන එතරම් අවබෝධයක් තිබිණි යැයි කිව නො හැකි ය. ඒ මහතාට එකල සිටි බොහෝ දේශපාලනඥයන්ට වඩා රටට අවශ්‍ය කුමක් ද යන්න පිළිබඳ ව ඉවක් තිබූ නමුත් බොහෝ කරුණු ඒ මහතා දැනසිටියේ බ්‍රිතානියන්ගේ ඇසින් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය ආකාරයට කරුණු තේරුම්ගැනීම ඒ මහතාට පමණක් සුවිශේෂ වූ කරුණක් නො වී ය. අපට අපේ මතවාද, එනම් ප්‍රවාද, අපේ සංකල්ප හා කෙටියෙන් කියන්නේ නම් අපේ ම වූ දැනුමක් නොමැතිවිට බටහිර මතවාද ඔස්සේ ලෝකය බැලීමට සිදුවෙයි.

බණ්ඩාරනායක මහතා උඩරට හා පහතරට යනුවෙන් සිංහලයන් වර්ගකිරීමටත්, උඩරට හා පහතරට යනුවෙන් වෙන ම ප්‍රදේශ දෙකක් සැලකීමටත් පුරුදු වී සිටියේ බ්‍රිතානීන් අනුව යමින් ය. 1815 දීත් කන්ද උඩරට රාජ්‍යයට අයත් වූ ප්‍රදේශ උඩරට ලෙස සැලකීමට බ්‍රිතානීන් පියවර ගෙන තිබුණේ බෙදා පාලනයකිරීම යන ප්‍රතිපත්තියට රුකුලක් වශයෙන් මිස වෙනත් හේතුවක් නිසා නො වෙයි. මෙරට එක්සේසත් රටක් ලෙස සැලකීමට බ්‍රිතානීහු කිසිදිනෙක කැමති නො වූහ. ඔවුන්ගේ ඉතිහාසඥයෝ අතීතයේ සිට මෙරට බෙදුනු රටක් ලෙස සැලකූහ. වර්තමානයේ ද ඇතැම් ඉතිහාසඥයන් යැයි කියන්නන් ද බ්‍රිතානීන් අනුකරණය කිරීම මහා පාණ්ඩිත්‍යයක් ලෙස සලකන බැවින් බණ්ඩාරනායක මහතා එසේ කිරීම එතරම් පුදුමයක් නො වෙයි. බණ්ඩාරනායක මහතා මෙරටට ෆෙඩරල් හෙවත් සන්ධීය ක්‍රමයක් යෝජනා කෙළේ 1925 තරම් ඈත වකවානුවක බව එතුමාගේ ජේවිය දූ පුතුන් අමතකකිරීම අභාග්‍යයකි. පසුකලෙක තම වරද දුටු ඒ මහතා ඉන්පසුව කිසිකලෙක නැවතත් මෙරටට සන්ධීය ක්‍රමයක් යෝජනා නො

© Prof. Nalin De Silva

කෙළේ ය. එහෙත් ඒ මහතාගේ දූ පුතුන් හැට වියට ළඟාවෙද්දී ද තම පියා එතරම් තේරුමක් නැති තරුණ වියේ කරන ලද වැරැද්දක් නිවැරදි දෙයක් ලෙස දකින්නේ වයසට සරිලන පැසුණු බවක් ඔවුන්ට නො මැති බැවින් ය. පැසුණු බවත් සමග මනසෙහි යම් ස්වාධීනත්වයක් ලැබිය යුතු ය. එහෙත් මෙරට ඇතැමුන්ට ඊනියා පැසුණු බවක් සමග ලැබෙන්නේ පැසුණු හිස නිකටත්, උපැස් යුවළත්, බටහිරයන්ගේ ප්‍රවාද මත තව තවත් පරායත්තවීමත් පමණකි.

බණ්ඩාරනායක මහතාට තම පසුබිමට හරස්වෙමින් ජාතිකත්වය දැකීමේ හැකියාවක් තිබුණි. ඇතැමුන්ට ඒ අවස්ථාවාදී ක්‍රියාවක් විය හැකි ය. එහෙත් මෙරට යටත්විජිත විරෝධී අරගලයේ යම්කිසි ආකාරයක කොටස්කරුවකු වීමේ හැකියාව ඒ මහතාට තිබුණු බව අමතක නොකළ යුතු ය. ඒ මහතා තම සිංහල මහා සභාව ද සමගින් එක්සත් ජාතික පක්ෂයට එකතු වූයේ රට වෙනුවෙන් යමක් කිරීමේ බලාපොරොත්තු ඇතිව ය. එතුමා ලිබරල්වාදය දේශීයකිරීමට වෑයම්කළ අයකු ලෙස හැඳිනගත හැකි ය. එහෙත් ලිබරල්වාදය හෝ මාක්ස්වාදය හෝ එළුහරකා හා මීහරකා එකට බඳින ආකාරයෙන් දේශීය කළ හැකි නො වෙයි. මෙය ලිබරල්වාදයට හා මාක්ස්වාදයට පමණක් නොව නවකතාවට ද සිනමාවට ද භෞතික විද්‍යාවට ද වලංගු වෙයි. මෙරට ඇත්තේ සිංහල අකුරින් ලියැවුණු බටහිර නවකතා හා නළු නිළියන් සිංහල දෙබස් කියන විදේශීය චිත්‍රපටි ය. ඇතැම්හු ටෝල්ස්ටෝයි කතා සිංහලෙන් ලියති. තවත් අය ලෝරන්ස්ගේ කතා සිංහලෙන් ලියති. එසේත් නැතහොත් කෆ්කාගේ හෝ කුන්දේරාගේ කතා සිංහලෙන් ලියති. මේ එකකින්වත්, කුරසෝවාගේ, බර්ග්මාන්ගේ, ස්පිල්බර්ග් සිනමාව සිංහලෙන් කීමෙන්වත් අයින්ස්ටයින්ගේ භෞතික විද්‍යාව හෝ ක්වොන්ටම් භෞතිකය සිංහලෙන් කීමෙන්වත් මෙරට නිදහසට අබමල් රේණුවක හෝ වැඩක් නො සිදුවෙයි.

එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වූ බණ්ඩාරනායක මහතා ලිබරල්වාදී පක්ෂයක් ලෙස ශ්‍රී ල නි ප ඇරඹී ය. එය ද මුල දී කිහිප දෙනකුගේ අදහස්වලට ප්‍රධානත්වය දුන් බටහිර ලිබරල්වාදී අච්චුවේ පක්ෂයක් විය. එහෙත් ඒ පක්ෂයට ඒ ආකාරයෙන් වැඩිකල් පැවතීමට නො හැකිවිය. රටේ නිදහස පිළිබඳ ප්‍රශ්නය කරළියට පැමිණියේ ය. සිංහලයන්ගේ යටත්විජිත විරෝධී අරගලය ක්‍රියාත්මක වන්නේ බටහිරයන්ට සුපුරුදු තලයක නො වෙයි. බටහිරයන් දන්නේ ඔවුන්ගේ අච්චුවේ ක්‍රදයාත්මක වන ලිබරල්වාදී හෝ මාක්ස්වාදී ප්‍රවනතා ගැන පමණකි. 1948 දී දිනාගත් නිදහස ජනතාවට ලැබුණු නිදහසක් නොවන බව වැඩිකල් යෑමට මත්තෙන් සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට වැටහිණි. ඔවුහු විවිධ ක්ෂෙත්‍රවල නිදහස වෙනුවෙන් සටන් කළහ. එය ඇතැම් විට කතෝලික ආක්‍රමණයට එරෙහිව කළ එකක් විය. තවත් විටෙක එය බටහිර සංස්කෘතික ආධිපත්‍යයට එරෙහිව කළ එකක් විය. 1954 පමණ වන විට ඒ සියල්ල ගොණුවෙමින් පැවතුණි. ඒ ව්‍යාපාරයට යම් ප්‍රතිපත්ති සමූහයක් විය. බෞද්ධ කොමිසම් සභා වාර්තාවෙන් ප්‍රකාශිත වූයේ මේ ප්‍රතිපත්තිවලින් වැදගත් වූ දෑ ය. ඒ ප්‍රතිපත්ති ඉල්ලීම් ආකාරයෙන් ඉදිරිපත් වී නම් එයට ප්‍රධාන හේතුව ඒ සඳහා දේශපාලන සංවිධානයක් නො තිබීම ය. ඒ නිසාමත් ඒවා කිහිප දෙනකුගේ පමණක් ප්‍රතිපත්ති නො වීය. ඒ ප්‍රතිපත්ති සිංහලයන්ගේ යටත්විජිත විරෝධී අරගලයේ ප්‍රතිපත්ති විය. බෞද්ධ කොමිසම් සභාවේ වාර්තාව පිළිගැනීමෙන් බණ්ඩාරනායක මහතා කෙළේ ඒ ප්‍රතිපත්ති තමාගේ ද ශ්‍රී ල නි පක්ෂයේ ද ප්‍රතිපත්ති බවට පත්කරගැනීම ය. ශ්‍රී ල නිපක්ෂය ඒ ප්‍රතිපත්ති පිළිගැනීමෙන් පසු පක්ෂයක ප්‍රතිපත්ති ජනතා සහභාගීත්වයෙන් සකස්කෙරුණු දෑ බවට පත්විය. කිහිප දෙනකුගේ කමිටුවකින් ප්‍රතිපත්ති සකස්කර පසුව ඒ ජනතාවට ඉදිරිපත්කරනු වෙනුවට ජනතාවගේ සහභාගීත්වයෙන් සකස්කෙරුණු ප්‍රතිපත්ති ශ්‍රී ල නි ප ක්ෂයේ ද මහජන එක්සත් පෙරමුණේ ද ප්‍රතිපත්ති බවට පත්විය. ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති තීරණය කරන්නේ බණ්ඩාරනායකලාවත්, රාජපක්ෂලාවත් වෙන පක්ෂයක්වත් නොව ජනතාව යැයි කුමාරතුංග මහත්මිය පසුගිය දිනක කියා ඇත. ඒ ඇය ඇත්තක් කී අවස්ථාවකි. එහෙත් ඇයට අමතක වන්නේ ඇය ජනතාවට හොරා බටහිරයන්ගේ අවශ්‍යතාවට ශ්‍රී ල නි පක්ෂයේ ඒකීය ප්‍රතිපත්තිය සන්ධීය ප්‍රතිපත්තියක් බවට පත්කළ බව ය. බණ්ඩාරනායක ප්‍රතිපත්ති යනු 1955 පමණ වන විට සකස් කෙරුණු සිංහලයන්ගේ යටත්විජිත විරෝධී අරගලයේ ප්‍රතිපත්ති විය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම යටත්විජිත විරෝධී අරගලයේ ප්‍රතිපත්තියක් නොවේ යැයි කිසිවකු හෝ කියන්නේ ද? දෙමළ භාෂාවට නිසි තැන දීම මිස රාජ්‍ය භාෂා තත්වයක් අවශ්‍ය නො වී ය. ඉන්දියාවේ අද පවා දෙමළ රාජ්‍ය භාෂාවක් නො වෙයි. මෙරට ඒකීය හෙවත් එක්සේසත් රටක් ලෙස පැවතීම ද අද දවසේ යටත්විජිත විරෝධී අරගලයේ ප්‍රතිපත්තියකි. එය ශ්‍රී ල නි පක්ෂයේ ද ප්‍රතිපත්තිය විය. කුමාරතුංග මහත්මිය විසින් බටහිරයන්ගේ, එනම් යටත්විජිතවාදීන්ගේ, අවශ්‍යතාව මත වෙනස්කෙරුණු මේ ප්‍රතිපත්තිය අද ජනතාවගේ අවශ්‍යතාව මත නැවතත් ඒකීය බවට පත් වී ඇත. ඒ ආරම්භය ඉදිරියට ගෙනයෑම රාජපක්ෂ මහතාගේ කාර්යය වේ.

© Prof. Nalin De Silva